# දැනුම බා ගැනීමට ඉඩ දී අප බා ගැනීම

ඇතැම් දේශපාලන විද්‍යා මහාචාර්යවරු සහ කථිකාචාර්යවරු සිතා සිටින්නේ බටහිර සඟරාවකින් හෝ පොතකින් හෝ උපුටාගත් දෙයක් සිංහලෙන් හෝ ඉංගිරිසියෙන් හෝ නැවත ලිවීම මහා කාරියක් ලෙසය. මේ පඬිවරුන්ට නොතේරෙන කරුණ නම් බටහිරයන්ගේ දැනුමෙහි ඒජන්තයන්වීම තරම් පරාධීන බවක් තවත් නැති බවය. අද මෙරට බොහෝ උගතුන් තළු මර මර කියන කතාවක් නම් අද ඇත්තේ දැනුම මත පදනම් වූ සමාජයක් (නොලේජ් බේස්ඩ් සොසයිටි) බවය. මේ ප්‍රකාශයෙන් මතුවන කරුණු දෙකක් පිළිබඳ ව, ලංකාවේ පමණක් නොව වෙනත් රටවල ද සියලු උගත්තු නිහඬ වෙති. මා උගතකු නොවන බැවින් මට නිහඬ නොවී සිටීමට හැකි ය. ඒ කරුණු දෙක නම් මෙයට කලින් තිබූ සමාජ දැනුම මත පදනම් නොවී ද යන්නත්, අද කතාකරන දැනුම කාගේ ද යන්නත් ය. මීට වසර දහසකට තිබූ දැනුම්වලට වඩා වැඩි දැනුම් ප්‍රමාණයක් වර්තමානයෙහි ඇති බව සැබෑය. එහෙත් එදා ද සමාජය පදනම් වූයේ යම්කිසි දැනුමක් මත ය. එදා දැනුම බා ගැනීමට (ඊනියා ඩවුන්ලෝඩ් කිරීමට) පරිගණක නොතිබෙන්නට ඇත. එහෙත් දඩයම් කිරීමට එළවැළ නෙළීමට ආදියට ද දැනුම අවශ්‍ය වෙයි. දැනුම නැතිව සමාජයක් පැවතිය නොහැකිය. මිනිස් සමාජයෙහි පමණක් නොව සත්ත්ව සමාජයෙහි ද දැනුම වෙයි.

බටහිරයන් වත්මන් සමාජය ගැන කතා කිරීමේදී පමණක් දැනුම මත පදනම් වන්නේ යැයි කියන්නේ ඇයි? කලින් තිබූ සමාජවල දැනුම නො දැනුමද? එසේත් නැතිනම් වර්තමානයේදී මහා දැනුම් ප්‍රමාණයක් අවශ්‍ය බැවින් ද? බොහෝවිට ප්‍රශ්නයට පිළිතුර ලෙස ගෙන හැර දැක්වෙන්නේ දෙවැනි කරුණය. අද එදා මෙන් නොව මහා දැනුම් ප්‍රමාණයක් අවශ්‍ය යැයි කීමට කිසියම් උගතකු ඉදිරිපත්වනු ඇත. අපට පෙනීමට සලස්වන කරුණ එය වුව ද මේ දැනුම් කතාව පසුපස ඇත්තේ වෙනත් දෙයකි. ඉතා පැහැදිලිව එහි දී කරුණු දෙකක් නොකියා කියැවෙයි. පළමුවෙන් කියැවෙන්නේ වත්මන් දැනුම නියම දැනුම බවය. කලින් පැවැති සමාජවල තිබූ දැනුම යම් දැනුමක් යැයි පිළිගනු ලැබුව ද ඒ නියම දැනුමක් නොවේය යන්න ඉන් කියැවෙයි. ඒ දැනුම් මිථ්‍යාවීමට ද බොහෝ ඉඩකඩක් වේ යැයි ඔවුන් කියනු ඇත. දෙවැන්නෙන් කියැවෙන්නේ බටහිරයන් පසුගිය අවුරුදු පන්සීයක පමණ කාලයක නිර්මාණය කළ දැනුම පමණක් දැනුම බවය. අද දැනුම යැයි පැවසෙන දෙයට ඊනියා වාස්තවිකත්වයක් ආරෝපණය කර ඒ දැනුම බටහිරයන්ට සාපේක්ෂව ඔවුන් විසින් ඔවුන්ගේ ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය මත පදනම් වී නිර්මාණය කරන දැනුමක් බව ඔවුහු වසන් කරති. වර්තමානයෙහි ඇත්තේ දැනුම මත පදනම් වූ සමාජයක් යැයි කියන විට ඉන් කියාපාන්නේ කලින් තිබූ දැනුම් නොදැනුම් බව හෝ මිථ්‍යා බව හෝ යන්නත් දැන් දැනුම බටහිරයන්ගේ දැනුමක් නොව ඊනියා වාස්තවික දැනුමක් යන්නත්ය. දැන් ඇත්තේ දැනුම මත පදනම් වූ සමාජයක් යන්නෙන් අපට තහවුරු කෙරෙන්නේ අප බටහිරයන්ගේ දැනුම මත අපේ ජීවිත ආකල්ප ආදිය සකස්කර ගත යුතු බවය. වෙනත් අයුරකින් කියන්නේ නම් වර්තමානයෙහි ඇත්තේ දැනුම මත පදනම් වූ සමාජයක් යන්නෙන් කෙරෙන්නේ අන් කිසිවක් නොව බටහිර දැනුම් ආධිපත්‍යය තහවුරු කිරීමය. පසුගියදා සිහිකෙරුණු උපාලි විජයවර්ධන මහතා විසින් මෙරටට කෙරුණු විශිෂ්ටම සේවය වනුයේ උපාලි පුවත්පත් ආයතනය ආරම්භ කිරීමය. බටහිර දැනුම් ආධිපත්‍යයට එරෙහිව අද මෙරට නිර්මාණය වන දැනුම ජනතාව අතට පත්වන්නේ උපාලි පුවත්පත් ආයතනයෙහි ප්‍රකාශන ඔස්සේය. අද ජාතිකත්වය මත පදනම් වූ මතවාදයක් මෙරට ප්‍රචලිතවී ඇත්නම් ඒ කෙරී ඇත්තේ උපාලි ප්‍රකාශන ඔස්සේය.

දෙමළ ජාතිවාදය පිළිබඳ මතවා ද බොහෝමයක් නිර්මාණය කෙරී ඇත්තේ බටහිරයන් අතින් ය. මේ මතවාද සමහරක් අප විසින් සාකච්ඡා කෙරී ඇත. මේ ප්‍රශ්නයෙහි මූල බලය පිළිබඳ ප්‍රශ්නය බව අමුතුවෙන් කිව යුතු නොවෙයි. ලන්දේසීන් විසින් දුම්කොළ වගාව සඳහා ඉන්දියාවෙන් ගෙන්වනු ලැබූ දෙමළ ජනකායක් එවකටත් අද යාපන අර්ධද්වීපය නමින් හැඳින්වෙන ප්‍රදේශයෙහි වාසය කළ සිංහල, මලයාලම් (වෙළක්කාර හමුදා ලෙස බොහෝ විට ගෙන්වනු ලැබුයේද ජාවකයන් විසින් ගෙනෙනු ලැබුයේ ද කේරළයේ ජනතාවය. ඔවුන්ගේ බස මලයාලම් විය. අද යාපනයෙහි දෙමළ බසෙහි මලයාලම් ඌරුවක් ඇත්නම් එයට හේතුව ඒ මලයාලම් සම්භවය වෙයි.) ජනයා සමග මුසුවී වත්මන් යාපන දෙමළ ජනවර්ගය ඇතිවිණි. මේ දෙමළ ජනවර්ගය ඇතිවීමට පෙර යාපන අර්ධද්වීපයෙහි දෙමළ ජනවර්ගයක් යැයි කිවහැකි ජනවර්ගයක් නොවීය. ආර්ය චක්‍රවර්තී රාජ්‍යය යනුවෙන් හැඳින්වෙන රාජ්‍යය ඇතිකරන ලද්දේ මුහුදු කොල්ලකරුවන් විසින් බව ඉබන්බතූතා වැන්නන්ගේ ලිපි ලේඛනවලින් හෙළිදරව් වෙයි. එයට පෙර පොළොන්නරුවෙන් පන්නනු ලැබූ කාලිංග මාඝ ද චන්ද්‍රභානු ජාවකයා ද යාපන අර්ධද්වීපයෙහි තාවකාලිකව රජ කළ බව පෙනී යයි. එහෙත් ඒ එක් රාජ්‍යයක්වත් දෙමළ රාජ්‍යයක් වූ බවට සාධක නොමැත. අනෙක් අතට යාපන

© Prof. Nalin De Silva

රාජ්‍යය පැවතියේ සිංහල රජවරුන්ගේ ආධිපත්‍යයට යටත්ව ය. පෘතුගීසින් මෙරටට පැමිණි සමයේ ද ආර්ය චක්‍රවර්තී රජවරු සිංහල රජවරුන්ට පඬුරු තෑගි බෝග ගෙන ගොස් රජු ලෙස පෙනී සිටීම සඳහා සිංහල රජුගෙන් අවසර ලබාගත් බවට පෘතුගීසි ඉතිහාසඥයන්ම සපයන සාක්ෂි වෙයි.

ඈත අතීතයේ සිටම ලංකාවේ පැවතියේ එක්සේසත් රාජ්‍යයකි. මේ එක්සේසත් රාජ්‍යයේ ව්‍යවස්ථාදායකය වූයේ රජු ප්‍රමුඛ රාජ සභාවයි. ඈපාවරු හා මාපාවරු රජු වෙනුවෙන් මායාරට හා රුහුණු රට කරවූ අය වූහ. රුහුණු, මායා, පිහිටි යනු ඊනියා සන්ධීය ෆෙඩරල් ප්‍රාන්ත නොවීය. සිංහලයන් රට යනුවෙන් හැඳින්වූයේ ස්වාධීන රටවල් නොවන බව ඇතැම් දේශපාලන විද්‍යා මහාචාර්යවරුන් හැරෙන්නට අනෙක් සියල්ලෝම දනිති. පසු කලෙක රටේ මහත්තයා නමින් පදවියක් ඇතිවූයේ ද රටවල් ස්වාධීන නොවූ බැවින් ය. එසේ ස්වාධීන රටවල් තිබිණි නම් රටේ රජවරු මිස මහත්වරු පසුකලෙක හෝ ඇතිවිය නො හැකිය. ඉතිහාසය යනු වර්තමානය ද තේරුම් කරන්නක් විය යුතු ය. වර්තමාන සමාජය මෙසේ හැසිරෙන්නේ, නැත්නම් පවතින්නේ ඇයි ද යන ප්‍රශ්නයට දෙන ආංශික පිළිතුරක් ලෙස ද ඉතිහාසය යොදාගත හැකිවිය යුතු ය. යම් ඉතිහාස ප්‍රවාදයක් (මතයක්) වර්තමානය තේරුම් කරදීමට අසමත් නම් ඒ ප්‍රතික්ෂෙප කිරීමට අප නොමැලි විය යුතු ය. අටදහස් රට දොළොස්දහස් රට මෙන් ම උඩරටක් හා පහත රටක් ද අපට ඇත. උඩරට හා පහතරට යනුවෙන් නම්කෙරී ඇත්තේ සිංහල සම්ප්‍රදාය මත බව තේරුම්ගත යුතුය. ඇතැම් කාලවල යම් යම් ප්‍රදේශවල තාවකාලික බලවත්තු පහළ වී රටේ රජුට අභියෝගාත්මක ව ඇතැම් ප්‍රදේශ පාලනය කර ඇති බව පෙනී යයි. එවිට රටේ එක්සේසත් බව ඉතා තාවකාලික ව කැඩී ගිය විට රජවරු අර බලවතා පරාජය කර රට නැවත එක්සේසත් කිරීමට පියවර ගත්හ. මෙරට ඉතිහාසයේ දහ දොළොස් වතාවක් පමණ යම් රජකු නැවත රට එක්සේසත් කළ බව සඳහන් වන්නේ එබැවිනි. මෙහි දී වැදගත් ම පාඨය වනුයේ රට නැවත එක්සේසත් කිරීම යන්නය. මෙරට රාජ්‍ය පාලනයේ වැදගත්ම ලක්ෂණය වූයේ එක්සේසත් බවත් එය බිඳුණු අවස්ථා කිහිපයෙහි රට නැවත එක්සේසත් කිරීමත් ය. ඒ බව අවබෝධකර නොගත් එක් පඬියකු වරක් පවසා තිබුණේ මෙරට එක්සේසත් රාජ්‍යයක් ව පැවතියේ දහදොළොස් වතාවක් පමණක් බවය. මොවුන් විශ්වවිද්‍යාලවල ඉගැන්වීමෙන් පෙන්නුම් කරන්නේ බටහිරයන්ගේ මතය නියෝජනය කරන්නන්ගේ බුද්ධි මට්ටම කෙසේ වෙතත් ඔවුන්ට වැඩි තැනක් ලැබෙන බව ය.

යාපන රාජ්‍යය සිංහල රජවරුන් විසින් සලකනු ලැබ ඇත්තේ රුහුණු මායා වැනි තවත් ප්‍රදේශයක් ලෙසින් යැයි අපට සැලකිය හැකිය. එහෙත් හයවැනි පරාක්‍රමබාහු රජුගේ සමයෙහි මේ ආර්ය චක්‍රවර්තී රජු යම් ප්‍රමාණයකට බලවත් වී ස්වාධීනත්වයක් ලබාගත් බව පෙනෙයි. ආර්ය චක්‍රවර්තී පාලනය පුරා ම ගත් කල ඒ අවස්ථාවේදී පමණක් රටේ එක්සේසත් බව නැති වී ගියේය. එවිට රජු සිංහල සම්ප්‍රදාය අනුව සපුමල් කුමරු යවා පාලකයා පරාජය කර රට නැවත එස්සේසත් කළේය. මේ එක්සේසත් බව ගැන පමණක් නොව මුළු රටේම රාජ්‍ය භාෂාව සිංහල වූ බවට වැදගත් සාක්ෂියක් වෙයි. 1568 පෘතුගීසින් හා යාපනය රාජ්‍යය අතර ඇතිවූ ගිවිසුම ඇත්තේ සිංහල හා පෘතුගීසි භාෂාවලින් මිස පෘතුගීසි හා දෙමළ භාෂාවලින් නො වෙයි. පෘතුගීසි ලන්දේසි හා බ්‍රිතානි යටත්විජිතවාදීන් විසින් මුහුදුබඩ පළාත් අල්ලාගනු ලැබීමෙන් පසු සිංහල රජවරුන්ට අවශ්‍ය වූයේ යටත්විජිත පාලකයා පන්නා දමා නැවත රට එක්සේසත් කිරීමට ය. ඒ අරුතින් ගත් කල යටත්විජිත පාලකයන් මුහුදුබඩ පෙදෙස් පාලනය කිරීම සිංහල සම්ප්‍රදායට අනුව ප්‍රාදේශීය පාලකයකු බලවත් වී තාවකාලික ව ස්වාධීන පාලනයක් ඇති කර ගැනීමට සමාන විය. බ්‍රිතානීන් ගිවිසුමකින් මුළු රටේම පාලනය ලබාගන්නා තෙක්ම සිංහල නායකයන්ට හා රජවරුන්ට අවශ්‍ය වී ඇත්තේ රට නැවත එක්සේසත් කිරීමට ය. දෙමළ ජාතිවාදීන්ට අනුග්‍රහ දක්වන බටහිරයන්ට අවශ්‍ය වී ඇත්තේ වෙනත් ඉතිහාසයක් ගොඩනැගීමටය. ඒ සඳහා ඔවුහු ලන්දේසි සමයේ සිටම ක්‍රියාත්මක වූහ. යාපනයේ ලන්දේසි ආණ්ඩුකාරයා දෙමළ මුදලිවරයකු ලවා වයිපව මාලෙයි නම් බොරු ඉතිහාස පොතක් කවියෙන් ලියවා ගැනීමෙන් මේ කාර්යය ආරම්භ විය. ලන්දේසීන්ට අවශ්‍ය වූයේ නැගෙනහිර වෙරළේ අයිතිය සිංහල රජුගෙන් උදුරා ගැනීම බව පැහැදිලිය. අද ඊනියා නිජභූමි සංකල්පයක් මත බොරු ඉතිහාස දැනුමක් ගොඩනැගීමට උත්සාහ කරන්නේ සිංහලයන්ට උතුරු හා නැගෙනහිර පළාත් අහිමි කිරීමට ය. බටහිරයන්ගේ දැනුම මත පදනම් වූ සමාජය පිළිබඳ සංකල්පය අවසානයේදී ඔවුන්ගේ යටත්විජිතවාදය තහවුරු කිරීම සඳහා බව අප අමතක නොකළ යුතුය. ඔවුන් අපට දැනුම බාගැනීමට උපදෙස් දෙන්නේ ඔවුන්ට අප බාගැනීම පහසුකිරීම සඳහාය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva